# අ.පො.ස උසස් පෙළ

# ව්‍යාපාර අධ්‍යයනය





## 7.6.4 චෙක්පත් භාවිතයෙන් ගනුදෙනු පහසු කර ගත හැකි ආකාරය

## 7.6.4 නිපුණතා මට්ටම :

චෙක්පත් භාවිතයෙන් ගනුදෙනු පහසු කර ගත හැකි ආකාරය

## ඉගෙනුම් ඵල :

- චෙක්පත් රේඛනය හඳුන්වා එහි අවශ්‍යතාවය පැහැදිලි කරයි.
- දෙන ලද රේඛිත චෙක්පත් අධ්‍යයනයෙන් ඒවායේ ඇටි රේඛන වර්ග කරයි.
- සාමාන්‍ය රේඛනය හා විශේෂ රේඛනය කළ හැකි ආකාර පැහැදිලි කරයි.

## සටහන:

### චෙක්පත් රේඛනය

චෙක්පතක මුහුණත හරහා සමාන්තර රේඛා දෙකක් ඇඳීම හෝ වාණිජ බැංකුවක නමක් සඳහන් කිරීම රේඛනය ලෙස හඳුන්වයි.






### චෙක්පත් රේඛනය කිරීමේ අවශ්‍යතාවය

- චෙක්පතට අමතර ආරක්ෂාවක් සැලසීම.
- චෙක්පතෙහි සඳහන් වටිනාකම එහි ආදායකයාට ලැබීම සහතික කිරීම.
- බැංකු කවුන්ටරයෙන් මුදල් ලබා ගැනීම වැළැක්වීම.( රේඛිත චෙක්පත් බැංකු ගිණුමක තැන්පත් කළ යුතුයි. )

### රේඛන වර්ග

1. සාමාන්‍ය රේඛනය
2. විශේෂ රේඛනය


Copyright © e-thaksalawa.moe.gov.lk

## සාමාන්‍ය රේඛනය


වගන්ති සහිතව හෝ රහිතව චෙක්පතේ මුහුණත හරහා සරල සමාන්තර රේඛා දෙකක් ඇඳීම සාමාන්‍ය රේඛනය ලෙස හැඳින්වේ.

(1)



සරල සමාන්තර රේඛා දෙකක් පමණක් තිබීම සාමාන්‍ය රේඛනයයි.මෙවැනි රේඛිත චෙක්පතක් ගිණුමක් තැන්පත් කර , මුදල් ලබා ගත හැකිය.

(2)





මෙම චෙක්පත පිටසන් කර පැවරිය හැක.මින් අදහස් වන්නේ පවරන්නාට ඇති අයිතියට වඩා වැඩි අයිතියක් පැවරුම්ලාභියාට හිමි නොවන බවයි.එම නිසා මෙවැනි රේඛනයක් යෙදූ චෙක්පතක් ලබා ගැනීමේදී, පැවරුම්ලාභියා විසින් එම චෙක්පතට පෙර තිබූ අයිතීන් පිළිබඳව සැළකිළිමත් විය යුතුය.

(3)




මෙවැනි රේඛනයක් සහිත චෙක්පතක් ආදායකයාගේ ගිණුමේ පමණක් තැන්පත් කර මුදල් ලබා ගත යුතු බව අදහස් කරයි.ඒ අනුව මෙය පැවරීම සීමා කෙරෙන චෙක්පතකි.

(4)




මෙය සීමාකාරී සාමාන්‍ය රේඛනයකි.මෙවිට රේඛනයේ සඳහන්ව ඇති අගයට වැඩියෙන් චෙක්පතෙහි සඳහන් නොවිය යුතු වේ


Copyright © e-thaksalawa.moe.gov.lk